# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1689/22 - 2011 ජනවාරි 21 වැනි සිකුරාදා - 2011.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.–බී. 94/47 (III).

**(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) (*ආ*) සහ 21(2) (*ආ*) වගන්තිය යටතේ වූ නියමය

(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (*ආ*) වගන්තිය සහ 21(2) (*ආ*) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින්, මේ නියමය මගින් –

(*අ*) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය "ගලපාත රජ මහා විහාර පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(*ආ*) ගලපාත රජ මහා විහාර පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය.

2011 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

***ගලපාත රජ මහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේයර් ජනරාල්ගේ 2009 සැප්තැම්බර් මස 28 වැනි දින අංක ජීඒ/බීඑන්/09/50 දරන සැලසුමෙහි නිරූපිත දකුණු පළාතේ ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හුංගන්තොට ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 2.0216 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය :–

*උතුරට* : ආර්. එම්. සීලවතී සහ තවත් අය හිමිකම් කියන වාසලවත්ත ඉඩම, ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෛත්‍රී හේවාවසම් හිමිකම් කියන හෙට්ටිඅම්මවත්ත;

*නැගෙනහිරට* : එච්. ඩී. පියසීලී සහ පී. එච්. ගුණසේකර හිමිකම් කියන ගොළුවක්වත්ත සහ වීරසේකරගෙවත්ත, මාර්ගය, තිසරදීප කුමාර හිමිකම් කියන බද්දේවත්ත, පී. ඩී. වයලට් චන්ද්‍රාණි හිමිකම් කියන ගලගාව ඕවිට, යූ. ඒ. ශාන්ත ජයසිංහ සහ තවත් අය හිමිකම් කියන මොහොට්ටිගේවත්ත සහ හෙට්ටිගේවත්ත සහ ආරියවංශ අතුකෝරල සහ තවත් අය හිමිකම් කියන කපුගේපැලවත්ත;

*දකුණට* : හිල්ඩා පියසීලි සහ තවත් අය හිමිකම් කියන හුංගංතොටවෙල හෙවත් කැරුව;

*බස්නාහිරට* : පී. කුසුමලතා හිමිකම් කියන හේවාකපුහේවත්ත සහ ගනේවත්ත, මාර්ගය, යූ. ඒ. චමත් සුරනිමල සහ තවත් අය හිමිකම් කියන බකිනිගහලියද්ද සහ වේල්ල, ආර්. එම්. සීලවතී සහ තවත් අය හිමිකම් කියන වාසලවත්ත, ප්‍රාදේශීය සභා මාර්ගය.

02-117/1

---

එල්.ඩී.–බී. 94/47 (III)

## (269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත

6(2) (*ආ*) සහ 21(2) (*ආ*) වගන්තිය යටතේ වූ නියමය

(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (*ආ*) වගන්තිය සහ 21(2) (*ආ*) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින්, මේ නියමය මගින් -

(*අ*) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය "සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජ මහා විහාර පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(*ආ*) සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජ මහා විහාර පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය.

2011 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

***උපලේඛනය***

***සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජ මහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟපළාත කෝරළයේ සුළු කොට්ඨාසයේ සූරියගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද අංක මහ/වයිටීඑන්/2006/069ඒ අනුරේඛණයේ කැබලි අංක A, B, C, D හා E වශයෙන් පෙන්නුම් කර ඇති දෙල්ගහ කුඹුර, මැදකුඹුර, තොටාංග කුඹුර, විහාරෙවත්ත, දාතුපැල කුඹුර හා පූජාගොඩේ වත්ත නමැති ඉඩම් ඒකාබද්ධ වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටෙයාර් 4.3493 ක් විශාලත්වයෙන් යුත් සූරියගොඩ රජ මහා විහාරය සතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු භූමි ප්‍රදේශය :–

*උතුරට* : ඩබ්. එච්. එම්. රම්බංඩා සහ තවත් අය හිමිකම් කියන රදවා කුඹුර, පී. බී. රත්නායක හිමිකම් කියන උඩුවල ගෙදර වත්ත, ප්‍රාදේශීය සභා මාර්ගය, ආර්. ඩබ්. එම්. අබේරත්න බංඩා සහ තවත් අය හිමිකම් කියන ගෙදර කුඹුර සහ සෙලමුනේ කුඹුර;

| | | |
|---|---|---|
| *නැගෙනහිරට* | : | ආර්. ඩබ්. එම්. අබේරත්න බංඩා සහ තවත් අය හිමිකම් කියන ගෙදර කුඹුර සහ සෙලමුනේ කුඹුර, එම්. බී. රත්නායක හිමිකම් කියන ගමගෙදර වත්ත, ගෙවල්වලට යන මාර්ගය, ආර්. එම්. සෙනෙවිරත්න සහ තවත් අය හිමිකම් කියන ගමගෙදර වත්ත සහ ගෙවල්වලට යන මාර්ගය; |
| *දකුණට* | : | ගෙවල් වලට යන මාර්ගය, ආර්. එම්. සෙනෙවිරත්න සහ තවත් අය හිමිකම් කියන පැලැන වත්ත, හීංකෙන්ද සහ තවත් අය හිමිකම් කියන පැලැන වත්ත, ප්‍රාදේශීය සභා මාර්ගය, එස්. අත්තනායක සහ තවත් අය හිමිකම් කියන නයිකොටාදෙනිය හා ගෙවල්වල සිට එන මාර්ගය; |
| *බස්නාහිරට* | : | ගෙවල්වල සිට එන මාර්ගය, ටී. විජේවීර සහ තවත් අය හිමිකම් කියන බරක් මනියවත්ත හා ඩබ්. එච්. එම්. රම්බංඩා සහ තවත් අය හිමිකම් කියන රදවා කුඹුර. |

02-117/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.